# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2019 දෙසැම්බර්

උක්ත විභාගය සඳහා පෙනී සිටීමට අපේක්ෂා කරන සියලු ම පාසල් හා පෞද්ගලික අයදුම්කරුවන් වෙනුවෙන් 2019 මැයි මස 02 දින සිට මැයි මස 24 වන දින තෙක් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත පෞද්ගලික අයදුම්කරුවන් සඳහා පමණි. සෑම පෞද්ගලික අයදුම්කරුවකු ම මෙම නිවේදනය සම්පූර්ණයෙන් කියවා හොඳින් අවබෝධ කර ගෙන තම අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය. **අයදුම්පත්‍රයේ නගර අංකය හා විෂය අංක සටහන් කිරීමේ දී නිවැරදි අංකය ම සටහන් කිරීමට විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.**

02. **පාසල් අයදුම්කරුවන් සඳහා අයදුම්පත් ඃ**

මීට පෙර අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා සිසුන් ඉදිරිපත් කරන ලද රජයේ පාසල් හා අනුමත පිරිවෙන්වලට අදාළ අයදුම්පත් 2019.05.02 දින වන විට ලැබෙන පරිදි තැපැල් කර යවා ඇත. මේ වන විටත් යම් පාසලකට මෙම අයදුම්පත් ලැබී නොමැති නම් මෙම දෙපාර්තමේන්තුවේ පාසල් විභාග සංවිධාන ශාඛාවට ඒ බව වහාම දැනුම් දිය යුතු වේ.

| |
|---|
| **මෙම විභාගයට පෞද්ගලිකව අයදුම් කළ හැක්කේ පාසලෙන් අස්වී ඇති අයදුම්කරුවන්ට පමණි. පාසල් ශිෂ්‍යයකු වශයෙන් සිටියදී පෞද්ගලික අයදුම්කරුවකු ලෙස විභාගයට ඉල්ලුම් කිරීම නීති විරෝධී වේ. එවැන්නක් අනාවරණය වුවහොත් විභාග තහනමකට ලක්වනු ඇත.** |

03. **පෞද්ගලික අයදුම්කරුවෝ ඃ**

රජයේ පාසලක හෝ ගාස්තු අය නොකරන අනුමත පාසලක හෝ පිළිගත් පිරිවෙනක හෝ ඉගෙනීම නොලබන කෙනකුට අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා පෞද්ගලික අයදුම්කරුවකු ලෙස ඉල්ලුම් කළ හැකි ය. මෙම විභාගය සඳහා පෞද්ගලික අයදුම්කරුවන්ගෙන් 2019 මැයි මස 24 වැනි දින තෙක් අයදුම්පත් භාරගනු ලැබේ.

04. **පෞද්ගලික අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීම සඳහා තම ස්ථිර පදිංචි ස්ථානයට ආසන්න නගරය දී ඇති නගර නාම ලේඛනයෙන් තෝරා ගත යුතු ය. (ඒ ඒ දිස්ත්‍රික්ක යටතේ නගර දක්වා ඇත.) එසේ තෝරා නොගැනීමෙන් වෙනත් විභාග මධ්‍යස්ථානයක් ලැබුනහොත් කිසිදු හේතුවක් නිසාවත් විභාග මධ්‍යස්ථානය වෙනස් කරනු නොලබන අතර ඔබ තෝරාගත් නගරය ද කිසිසේත්ම පසුව සංශෝධනය කරනු නොලැබේ.**

05. මෙම දැන්වීමෙහි ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව තම තමන්ගේ අයදුම්පත් අයදුම්කරුවන් විසින් ම පිළියෙල කරගත යුතු ය.

06. අයදුම්පත් සෙ.මී. 28 x 21 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර ගත යුතු අතර, අංක 01 සිට 12 තෙක් මුල් පිටුවේ ද, අංක 13 සිට 14 තෙක් පසු පිටුවේ ද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය සකස් කර ගත යුතු ය. ඔබ එවන අයදුම්පත්‍රය ආදර්ශ අයදුම්පත්‍රය අනුව ම විය යුතු ය.

07. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **" විභාග කොමසාරිස් ජනරාල්, පාසල් විභාග සංවිධාන ශාඛාව, තැ.පෙ. 1503, කොළඹ."** යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි, **අ.පො.ස.(සා.පෙළ) දෙසැම්බර් 2019** ලෙස හා **"නගර අංකය ............ "** ලෙස ද සඳහන් කරන්න.

08. එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ **එක් අයදුම්පතක්** පමණි. **යම් අයදුම්කරුවකු එක් අයදුම්පතකට වඩා ඉදිරිපත් කළහොත් විභාග අපේක්ෂකත්වය හෝ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු සියලු ම විභාග ප්‍රතිඵල හෝ අවලංගුවන බව තරයේ දැන සිටිය යුතු ය. එසේම දීර්ඝ කාලීන විභාග තහනමකට ද ලක්විය හැකි ය.** තවද, එක කවරයක අඩංගු කළ යුත්තේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පත් නිවැරදිවත් පැහැදිලිවත් තමාගේ අත් අකුරින් ම සම්පූර්ණ කළ යුතු අතර, ඒ සඳහා දී ඇති උපදෙස් තරයේ අනුගමනය කළ යුතු ය.

09. වෙනත් ආයතන විසින් සකස් කොට **මුද්‍රණය කර ඇති ආකෘති පත්‍ර** මේ සඳහා යොදාගනු ලබන්නේ නම් මෙම දැන්වීමෙහි දක්වා ඇති **විෂය අංක හා නගර අංකවලටත්** ආදර්ශ ආකෘති පත්‍රයේ දක්වා ඇති අනෙක් **සියලු ම තොරතුරුවලටත් අනුකූල විය යුතු ය.** එසේම වෙනත් පෞද්ගලික මුද්‍රණායතනවල පිළියෙල කරනු ලබන අයදුම්පත්‍ර ආකෘතිවල, විෂය ලේඛනවල හෝ නගර අංකවල හෝ මුද්‍රිත වැරදි තොරතුරු සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව වගකියනු නොලබන අතර, විභාග දෙපාර්තමේන්තුවේ නිල නිවේදනය ලෙස සැලකෙන මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් ආකෘතියට ම අනුකූලව මෙහි සඳහන් තොරතුරු ද උපයෝගී කරගෙන විභාගයට අයදුම් කිරීම අයදුම්කරුවන්ගේ වගකීමකි.

10. **අනන්‍යතාව ඔප්පු කිරීම ඃ**

අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රවලට ඉදිරිපත්වීම සඳහා විභාග ශාලාවට පැමිණෙන සෑම අවස්ථාවකදී ම තම අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා පහත දැක්වෙන හැඳුනුම්පත්වලින් **එකක්** ඉදිරිපත් කළ යුතු වේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට්)

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

11. **විභාග ගාස්තු ඃ**

**සියලු ම පෞද්ගලික අයදුම්කරුවන් තමන් පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂය සංඛ්‍යාව අනුව නියමිත විභාග ගාස්තු ගෙවිය යුතු වේ.**

තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට හෝ නියමිත විභාග ගාස්තුව ගෙවා කුවිතාන්සියක් ලබාගත යුතු ය. ගාස්තුව ගෙවන ලද කුවිතාන්සිය ඉල්ලුම්පතේ අදාළ කොටුවේ අලවා එවිය යුතු ය. (එහි ඡායා පිටපතක් හා ඉල්ලුම් පත ලියාපදිංචි කළ රිසිට් පත අයදුම්කරු සතුව තබා ගත යුතු ය.) මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

**විශේෂයෙන් සැලකිය යුතුයි ඃ**

(අ) මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු සම්පූර්ණයෙන් හෝ අඩක් හෝ ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක ගාස්තුව වශයෙන් මාරු කිරීම හෝ කරනු නොලැබේ.

(ආ) **විභාගයට අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු කිසිදු හේතුවක් නිසා විභාග මධ්‍යස්ථානය හෝ අයදුම් කරන ලද මාධ්‍යය හෝ අයදුම් කරන ලද විෂයයන් හෝ වෙනස් කරනු නොලැබේ. එබැවින් ඔබගේ අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කළ යුතු ය.**

(ඇ) **අයදුම්පත් කැඳවීම අවසන් කරන දිනට පසුව** තැපැල් කාර්යාලවලට **මුදල් ගෙවා ඇති** අයදුම්පත්‍ර **සහ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

(ඈ) දෙවන විෂය කාණ්ඩයට අයත් පහත සඳහන් විෂයයන් සඳහා අයදුම් කරන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටිය යුතු වේ. **අවසන් ප්‍රතිඵලය දෙනු ලබන්නේ ලිඛිත හා ප්‍රායෝගික යන කොටස් දෙක සඳහා ම පෙනී සිටි අයදුම්කරුවන් සඳහා පමණි.**

(40) සංගීතය (පෙරදිග)
(41) සංගීතය (අපරදිග)
(42) සංගීතය (කර්ණාටක)
(44) නැටුම් (දේශීය)
(45) නැටුම් (භාරතීය)
(50) නාට්‍ය හා රංග කලාව (සිංහල)
(51) නාට්‍ය හා රංග කලාව (දෙමළ)
(52) නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි)

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

6/4/2019/OL
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ.පෙ. 1503, කොළඹ.
2019 මැයි මස 02 වැනි දින.

## අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

01. විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන පහත දක්වා ඇති නගර නාම ලේඛනයෙන් තමන් **තෝරාගත් දිස්ත්‍රික්කය, නගරය හා නගර අංකය** පැහැදිලිව මේ කොටුවේ ලියන්න. **(දී ඇති නගර නාම ලේඛනයෙන්** තමාගේ ස්ථිර පදිංචි ස්ථානයට ආසන්න නගරය තෝරා ගන්න.)

02. සම්පූර්ණ නම **(උප්පැන්න සහතිකයේ දැක්වෙන පරිදි සම්පූර්ණ නම වාසගම සහිතව ඉංග්‍රීසි කැපිටල් අකුරින් හා සිංහලෙන් ලියන්න. නාම සංශෝධන සම්බන්ධයෙන් පසුව කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)**
උදාහරණ : (I) MALAGE CHAMARA JAYASINGHE
(II) මාලගේ චාමර ජයසිංහ

03. පෞද්ගලික ලිපිනය **(ඉංග්‍රීසි කැපිටල් අකුරින් හා සිංහලෙන් ලියන්න)**
උදාහරණ : (I) ඉංග්‍රීසියෙන් : NO. 10, SAMAGI MW., GALKULAMA, ANURADHAPURA
(II) සිංහලෙන් : නො. 10, සමගි මාවත, ගල්කුලම, අනුරාධපුරය.

04. අදාළ කොටුවේ කතිර ලකුණ යොදන්න
උදාහරණ : පිරිමි අයදුම්කරුවකු නම් පිරිමි [0 ☒] ගැහැණු [1]

05. ඔබගේ උපන් දිනය අදාළ කොටු තුළ ලියන්න.

06. ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කරන්න. ජාතික හැඳුනුම්පත නොමැති නම් රියදුරු බලපත්‍රයෙහි හෝ විදේශ ගමන් බලපත්‍රයෙහි අංකය **සඳහන් කරන්න.**

07. අයදුම්පතෙහි පවතින අඩුපාඩු සම්බන්ධයෙන් විමසීමට අවශ්‍ය වන අවස්ථාවක ඔබව සම්බන්ධ කර ගැනීම සඳහා **ඔබගේ දුරකථන අංකය** මෙහි ලියන්න.

08. අදාළ කොටුවේ කතිර ලකුණ යොදන්න.
උදාහරණ : **සිංහල මාධ්‍යය** අයදුම්කරුවකු නම් සිංහල [2 ☒] දෙමළ [3] ඉංග්‍රීසි [4] ද්විමාධ්‍ය [5]
**මාධ්‍ය දෙකකින්** ඉදිරිපත් වන අයදුම්කරුවකු නම් සිංහල [2] දෙමළ [3] ඉංග්‍රීසි [4] ද්විමාධ්‍ය [5 ☒]

09. **විභාග ගාස්තු :**
(i) විභාග ගාස්තු වශයෙන් නියමිත මුදල තැපැල් කාර්යාලයකට හෝ උපතැපැල් කාර්යාලයකට හෝ ගෙවා ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ලබාගෙන අදාළ විස්තර අයදුම්පතේ ලියන්න. (එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ද ඔබ වෙත තබා ගන්න.)
(ii) එක් විෂයයක් සඳහා රු. 100/- (සියයයි), විෂයයන් දෙකක් සඳහා රු. 150/- (එකසිය පනහයි), විෂයයන් තුනක් සඳහා රු. 200/- (දෙසීයයි), විෂයයන් හතරක් සඳහා රු. 250/- (දෙසිය පනහයි), විෂයයන් පහක් සඳහා රු. 300/- (තුන්සියයි), විෂයයන් 06 සිට 09 තෙක් රු. 350/- (තුන්සිය පනහයි)

10. පෙනී සිටින විෂයයන් ගණන ලියන්න.
උදාහරණ : විෂයයන් 09කට පෙනී සිටින්නේ නම් [09]

11. මෙහි අවසානයට ඇති විෂය ලේඛනය අනුව තමන් පෙනී සිටින **විෂයයන්, විෂය අංක** හා **මාධ්‍යය*** නිවැරදිව ඇතුළත් කරන්න. **අයදුම් පත්‍රයෙහි සඳහන් කරන ලද විෂයයන් පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.** (සිංහල මාධ්‍යය - 2, දෙමළ මාධ්‍යය - 3, ඉංග්‍රීසි මාධ්‍යය - 4 ලෙස යොදන්න.)

**ඉතා වැදගත් : ***
**මාධ්‍ය දෙකකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් පමණක් මාධ්‍යය දැක්වෙන කොටු තුළ එක් එක් විෂයය සඳහා පෙනී සිටින භාෂා මාධ්‍යය සඳහන් කළ යුතුය. එක් මාධ්‍යයකින් සියලුම විෂයයන්ට පෙනී සිටින්නේ නම් මෙම භාෂා මාධ්‍යය කොටු සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවේ.**

**විෂයයන් තෝරා ගැනීම :**
(අ) පහත දක්වා ඇති සීමාවන්ට යටත්ව අයදුම්කරුවකුට විෂයයන් 09 ක් තෝරාගත හැකි ය.

| විෂය අංක | විෂයයන් |
|---|---|
| (11) සිට (16) තෙක් | ආගම |
| (21/22) | භාෂාව හා සාහිත්‍යය - (21) සිංහල / (22) දෙමළ |
| (31) | ඉංග්‍රීසි භාෂාව |
| (32) | ගණිතය |
| (33) | ඉතිහාසය |
| (34) | විද්‍යාව |
| (60) සිට (75) තෙක් | පළමු විෂය කාණ්ඩය |
| (40) සිට (52) තෙක් | දෙවන විෂය කාණ්ඩය |
| (80) සිට (94) තෙක් | තෙවන විෂය කාණ්ඩය |

**එක් එක් කාණ්ඩයෙන් එක් විෂයක් බැගින් පමණක් තෝරා ගත යුතු ය. විෂය අංක 21 සිංහල භාෂාව හා සාහිත්‍යය ඉල්ලුම් කරන අයදුම්කරුවකුට 64 දෙවන භාෂාව (සිංහල) විෂයය ඉල්ලුම් කළ නොහැකි ය. එසේම විෂය අංක 22 දෙමළ භාෂාව හා සාහිත්‍යය ඉල්ලුම් කරන අයදුම්කරුවකුට 65 දෙවන බස (දෙමළ) විෂයය සඳහා ඉල්ලුම් කළ නොහැකි ය.**

12. අයදුම්කරු අත්සන සහතික කරන අය වෙත යන විට උප්පැන්න සහතිකය හා ජාතික හැඳුනුම්පත ද රැගෙන යා යුතු ය. ජාතික හැඳුනුම්පත, අයදුම්පත්‍රය එවන අවස්ථාවේ දී ලබාගෙන නොමැති නම් රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය රැගෙන යන්න.

13. නියමිත විභාග ගාස්තු තැපැල් කාර්යාලයකට / උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගත් කුවිතාන්සිය නොගැලවෙන පරිදි අදාළ කොටුවේ අලවන්න.

14. **අත්සන සහතික කිරීම ඃ**
තමා පදිංචි ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරී විසින් ම සහතික කළ යුතු අතර, ග්‍රාම නිලධාරීගේ නම, ග්‍රාම නිලධාරී වසම හා එහි අංකය ඇතුළත් කර නිල රබර් මුද්‍රාවක් යොදා සහතික කළ යුතු ය.

15. **දෘශ්‍යාබාධිත අයදුම්කරුවන් /බ්‍රේල් මාධ්‍ය අයදුම්කරුවකු හෝ විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් ඃ**
දෘශ්‍යාබාධිත අයදුම්කරුවකු/බ්‍රේල් මාධ්‍ය අයදුම්කරුවකු (බ්‍රේල් මාධ්‍යයෙන් පිළිතුරු ලියන) හෝ විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවකු වෙනුවෙන් ඉදිරිපත් කරන අයදුම්පතෙහි වම් පස ඉහළ කෙළවරේ රතු පාටින් **"දෘශ්‍යාබාධිත අයදුම්කරුවෙකි/බ්‍රේල් මාධ්‍ය අයදුම්කරුවෙකි"** හෝ **"විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවෙකි"** යනුවෙන් සඳහන් කළ යුතුයි.

## විෂය ලේඛනය

**❋ ආගම්**
- (11) බුද්ධ ධර්මය
- (12) ශෛවනෙරි
- (14) කතෝලික ධර්මය
- (15) ක්‍රිස්තියානි ධර්මය
- (16) ඉස්ලාම්

**❋ භාෂාව හා සාහිත්‍යය**
- (21) සිංහල භාෂාව හා සාහිත්‍යය
- (22) දෙමළ භාෂාව හා සාහිත්‍යය

**❋ (31) ඉංග්‍රීසි භාෂාව**
**❋ (32) ගණිතය**
**❋ (33) ඉතිහාසය**
**❋ (34) විද්‍යාව**

**❋ පළමු විෂය කාණ්ඩය**
- (60) ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- (61) භූගෝල විද්‍යාව
- (62) පුරවැසි අධ්‍යාපනය
- (63) ව්‍යවසායකත්ව අධ්‍යයනය
- ● (64) දෙවන භාෂාව (සිංහල)
- ●● (65) දෙවන භාෂාව (දෙමළ)
- (66) පාලි
- (67) සංස්කෘත
- (68) ප්‍රංශ
- (69) ජර්මන්
- (70) හින්දි
- (71) ජපන්
- (72) අරාබි
- (73) කොරියන්
- (74) චීන
- (75) රුසියන්

**❋ දෙවන විෂය කාණ්ඩය**
- (40) සංගීතය (පෙරදිග)
- (41) සංගීතය (අපරදිග)
- (42) සංගීතය (කර්ණාටක)
- (43) චිත්‍ර
- (44) නැටුම් (දේශීය)
- (45) නැටුම් (භාරතීය)
- (46) ඉංග්‍රීසි සාහිත්‍ය රසාස්වාදය
- (47) සිංහල සාහිත්‍ය රසාස්වාදය
- (48) දෙමළ සාහිත්‍ය රසාස්වාදය
- (49) අරාබි සාහිත්‍ය රසාස්වාදය
- (50) නාට්‍ය හා රංග කලාව (සිංහල)
- (51) නාට්‍ය හා රංග කලාව (දෙමළ)
- (52) නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි)

**❋ තෙවන විෂය කාණ්ඩය**
- (80) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- (81) කෘෂි හා ආහාර තාක්ෂණය
- (82) ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය
- (84) ශිල්ප කලා
- (85) ගෘහ ආර්ථික විද්‍යාව
- (86) සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- (87) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- (88) නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය
- (89) නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය
- (90) නිර්මාණකරණය, විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය
- (92) විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය (සිංහල)
- (93) විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය (දෙමළ)
- (94) විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය (ඉංග්‍රීසි)

● මව්බස දෙමළ අයදුම්කරුවන් සඳහා දෙවන බස
●● මව්බස සිංහල අයදුම්කරුවන් සඳහා දෙවන බස